# ධීවර අමාත්‍යාංශය

## විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

# ඇබෑර්තු

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ පහත සඳහන් පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### (01) අභ්‍යන්තර විගණක තනතුර - තනතුරු 01 යි - ප්‍රධාන කාර්යාලය, බත්තරමුල්ල.

**සුදුසුකම් හා පළපුරුද්ද : බාහිර සුදුසුකම්**

කළමනාකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ ප්‍රථම උපාධියක් පැවතීම

**හෝ**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම් සපුරා තිබීම

**හෝ**

වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම් සපුරා තිබීම

**හෝ**

සහතිකලත් හා ආයතනික ගණකාධිකාරී සංගමයේ (ACCA) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම් සපුරා තිබීම

**හෝ**

ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම

**සහ**

රජයේ දෙපාර්තමේන්තුවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ගිණුම්කරණය හා මුදල් පිළිබඳ අඩුතරමින් එක් (01) වසරක පළපුරුද්ද ලබා තිබීම.

**සුදුසුකම් හා පළපුරුද්ද : අභ්‍යන්තර සුදුසුකම්**

අධිකාරියේ මුදල් අංශයේ කනිෂ්ඨ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** MM 1-3-2016 රු. (55,925-10x1375-15x1910- 98325)

**වයස් සීමාව :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහත වයස් සීමාව අදාළ නොවේ.

### (02) තාක්ෂණ නිලධාරී තනතුර - තනතුරු 02 - ප්‍රධාන කාර්යාලය, බත්තරමුල්ල

**සුදුසුකම් හා පළපුරුද්ද : බාහිර සුදුසුකම්**

සිවිල් තාක්ෂණ වේදය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ (ජා.වෘ. සුදුසුකම්) NVQ මට්ටම 5 ට අඩු නොවන සහතික පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

**සුදුසුකම් හා පළපුරුද්ද : අභ්‍යන්තර සුදුසුකම්**

බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

**වැටුප් පරිමානය :**

MA 2-1 - රු. (30,310 - 10 x 300 - 7 x 350 - 4 x 495 - 20 x 660 - 50,940)

**වයස් සීමාව**

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**පොදු කොන්දේසි**

❖ රජයේ / පළාත් පාලන දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

❖ අයදුම්කරු ශ්‍රීලාංකික පුරවැසියකු විය යුතුය.

❖ තනතුරට අදාළව පවරනු ලබන රාජකාරී ඉටුකිරීමටත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් කායික හා මානසික යෝග්‍යතාවය සහිත අයකු විය යුතුය. මනා චරිතයකින් හෙබි විය යුතුය.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙන් පිරිනැමෙන අනෙකුත් වරප්‍රසාද පහත සඳහන් වේ.

❖ වෛද්‍ය ප්‍රතිලාභ

❖ අනුමත තනතුරුවලට අනුමත වෘත්තීය දීමනා සහ අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

❖ සේ.අ. අරමුදල සහ සේ.භා. අරමුදල

**ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් එවීමේදී පහත සඳහන් තොරතුරුද ඉදිරිපත් කළ යුතුය.**

❖ ජීව – දත්ත පත්‍රිකාව

❖ සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා සහතිකවල සහතික කළ පිටපත්

සම්පූර්ණ විස්තර අඩංගු අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුරු නාමය පැහැදිලිව සඳහන් කොට, "**සභාපති, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා අධිකාරිය, නො. 41/1, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල**" වෙත මෙම දැන්වීම පළවී දින 14 ක් ඇතුළත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය.**
**දිනය : 2021.01.19**